

# "සුද්දගෙ වැඩ හරි කෙලින්ද ?.

"සුද්දගෙ වැඩ හරි කෙලින්. ඔය අල්ලසට යාළු මිත්‍ර කමට ඇදල සුද්දො වැඩ කරන්නෙ නැහැ."

හීන මානයෙන් පෙලෙන බොහෝ සිංහලයින් නිතර කියන කතාවක් තමයි ඔය. ඕසට්‍රේලියාවේ වසන අයටනම්, ක්වීන්ස්ලන්තයේ හිටපු මහ ඇමති සර් - ජෝ වැන්නන් අල්ලස් හා දූෂණ චෝදනා මත බන්ධනාගාර ගතවූ අන්දම දන්නා නිසා, මෙවැනි දේ සිදුවන බව හොඳට දනී.

එහෙත් ලංකාවේ අල්ලස් ඉතිහාසයේ මහා සුද්දන්ගේ භූමිකාව, දන්නේ කීයෙන් කීදෙනාද? පසුගිය ශතවර්ෂයේදී ප්‍රසිද්ධියට පත්, අල්ලස් පිළිබඳ ව්‍යංගයක්, හෙලිවූයේ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේය. කතන්දරය මෙසේය.

මුළු අප්‍රිකාවේම යටත් විජිතයන්හි දුම්රිය මාර්ග ඉදිකරවන ලද්දේ, මහා කෝටිපති රෝඩ්ස් නැමැති ව්‍යාපාරිකයෙකි. ඔහු කොතරම් බලවතෙක් වීද යත්, මහද්වීපයේ විශාල භූමි ප්‍රමාණයක්, ඔහුගේ නමින් යටත් විජිත වාදීන්, " බෞතීස්ම" කරන ලදී. එහි නම රොඩේසියාවයි. පසුකාලයකදී මෙය උතුරු රොඩේසියාව හා දකුණු රොඩේසියාව මෙන් කොටස් දෙකකට බෙදන ලදී. අද උතුරු රොඩේසියාව "සැම්බියා" යනුවෙන් ස්වාධීන රාජ්‍යයකි. එතකොට දකුණු රොඩේසියාව ???

දකුණු රොඩේසියාව තමයි අද විශාල ආන්දෝලනයකට පත් වී තිබෙන, සිම්බාබ්වේ ජන රජය.

ඒවා වෙනම කතාය. අපි දැන් රෝඩ්ස් හා ලංකාවට ඇති සම්බන්ධය බලමු. දකුණු අප්‍රිකාවේ, "මීටර් ගේජ්" ප්‍රමාණයේ දුම්රිය මාර්ගයක් ඉදිකිරීමටත් ඒවාට මැදිරි හා වෙනත් උපකරණ සැපයීමටත්, රෝඩ්ස් සමාගම ගිවිසුමක් ඇති කරගන්නා ලදී. ගිවිසුම යටින් කුමන්ත්‍රණයක් ද විය. ඒ කුමන්ත්‍රණය නම් මීටර් ගේජ් වෙනුවට ඊට වඩා කුඩා "නැරෝ ගේජ්" දුම්රිය මාර්ගයක් ඉදිකිරීමය.

අවාසනාවකට මෙන්, ඉදිකිරීම අවසන් වීමට පෙර, ගිවිසුමට සම්බන්ධ සුදු සාමාන්‍යාධිකාරි වරයා මිය ගියේය. අළුතෙන් පත් වූ සාමාන්‍යාධිකාරි වරයා මේ දුම්රිය මාර්ගය, පිළිගැනීම ප්‍රතික්ෂේප කලේය. ඔහු කියා සිටියේ ගිවිසුමට අනුව " මීටර් ගේජ්" දුම්රිය මාර්ගයක් සැපයිය යුතු බවය.

එංගලන්තය සමාගම, ලොව පුරා සොයා බැලුවේ, කුමණ යටත් විජිතයකට මේ පටු දුම්රිය මාර්ගය, පැටවිය හැකිද යන්න ගැනය. මේ කාලයේදී ලංකාවේ වතු සුද්දෝ බඩු ගෙන යාමට හා වතු කම්කරුවන්ගේ ගමන් පහසුව සඳහා කොළඹ සිට ඕපනායක දක්වාත්, අවිස්සාවේල්ලේ සිට යටියන්තොට දක්වාත් දුම්රිය සේවයක් අවශ්‍ය බව කියමින් සිටියහ. මෙය සැලවූ වහාම එංගලන්තයේ කොම්පැනි කාරයෝ ලංකාවේ ඉංග්‍රීසි ආණ්ඩුකාර වරයා විශාල අල්ලසකින් පොළඹවාගෙන කැළණි වැලි දුම්රිය මාර්ගය ඇරඹූහ. තවත් සැලසුම් කිහිපයක දුම්රිය පීලි ඉතුරු වී තිබූ නිසා ඒවා නානුඔය සිට රාගම දක්වා තවත් මාර්ගයක් අරඹා, කටයුත්තක් සම්පූර්ණ කරන ලදී. ලංකා ඉතිහාසයේ ඔප්පු නොවූ එහෙත්, බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ රැව්දුන් මහා පරිමාණයේ අල්ලස් අන්දරය එය වේ.

○ ○ ○

ලංකාවට සර්ව ජන ඡන්ද බලය හා ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය ලැබුණේ 1931 දීය. ඒ අනුව, මැතිවරණය කොට්ටාස පිළිවෙලින්, මන්ත්‍රී වරුන් 50 දෙනෙකු තෝරා ගන්නා අතර, මන්ත්‍රී වරු 8 දෙනෙකු ආණ්ඩුකාර වරයා විසින් පත්කරනු ලැබේ. ඒ 8 දෙනා පත්කෙරෙන්නේ යුරෝපීය, මැලේ, බර්ගර්, ආදී ජනකොටස් වෙනුවෙනි.

1943 වනවිට, අල්ලස් පිළිබඳ විවිධ චෝදනා, ඇතැම් මන්ත්‍රී වරුන්ට විරුද්ධව එල්ල වන්නට තිබුණි. මේ නිසා, එම චෝදනා ගැන සොයා බැලීම සඳහා කොමිෂන් සභාවක් පත් කරණ ලදී. කොමිෂන් සභාවේ සභාපතිවරයා වූයේ, රාජ නීතිඥ L. M. D. ද සිල්වා මහතාය. කොමිෂන් සභාවේ වාර්තාව පිටවූ විට ඔප්පු වූයේ ඡන්දයෙන් පත් වූ මන්ත්‍රී වරුන් අතරින් H. M. ගුණසේකර (බලංගොඩ) E. R. තම්බිමුත්තු (ත්‍රිකුණාමලය) E. W. අබේගුණසේකර (නුවරඑළිය) හා D. D. ගුණසේකර (බණ්ඩාරවෙල) යන සිව් දෙනා වැරදි කරුවන් වී ඇති බවය.

එහෙත් බොහෝ දෙනා මවිතයට පත් වූයේ, ආණ්ඩුකාරවරයා විසින් පත් කරන ලද H. S. ෆාරික්, E. C. විලියර්ස් සහ H. E. නිව්න්හැම් යන මන්ත්‍රීන් තිදෙනා ද අල්ලස් හා දූෂණ චෝදනාවලට වැරදිකරුවන් වී තිබීමය. මේ වැරදිකරුවන් 7 දෙනාටම අසුන් අහිමි විය. 7 වසරකට ඡන්ද බලයස අහිමි විය.

ඉංග්‍රීසි ජාතීන්ට විරුද්ධව තිබූ චෝදනාව කුමක්ද?

ඒ කාලයේ මන්ත්‍රීවරයෙකුගේ වැටුප මසකට රු. 500කි. එහෙත් මේ චූදිත මන්තීවරු තිදෙනාට, පිළිවෙලින් ලංකා වෙළඳ සංගමය (Chaucer of Commevee) යුරෝපීය වැවිලි කරු සංගමය හා කොළඹ හෝටල් සංගමය යන ආයතන වලින් මසකට රු. 1500/= ක පාරිතෝෂික දීමනාවක් ගෙවා තිබුණි. ඒ හැර ඔවුනට, ගෝල්ෆේස්, ගල්කිස්ස, නුවර ක්වීන්ස්, G. O. H. නුවරඑළියේ ග්‍රෑන්ඩ් ආදී හෝටල් වල සියළු පහසුකම්ද, යුරෝපීය සමාජ ශාලාවල විශේෂ වරප්‍රසාදද ලැබුණි. මේ සියළු වරප්‍රසාද, අල්ලස් බව පෙන්වා දෙන ලද්දේ හම්බන්තොට මන්ත්‍රී D. M. රාජපක්ෂ හා නාරම්මල මන්ත්‍රී සිරිපාල සමරක්කොඩි යන මහත්වරුන් විසිනි.

ඊලඟට අල්ලස් කොමිෂන් සභාවක් පත් කරන ලද්දේ S. W. R. D. බණ්ඩාරනායක මහතාගේ නිර්දේශයක් මතය.

> ***එංගලන්තය සමාගම, ලොව පුරා සොයා බැලුවේ, කුමණ යටත් විජිතයකට මේ පටු දුම්රිය මාර්ගය, පැටවිය හැකිද යන්න ගැනය. මේ කාලයේදී ලංකාවේ වතු සුද්දෝ බඩු ගෙන යාමට හා වතු කම්කරුවන්ගේ ගමන් පහසුව සඳහා කොළඹ සිට ඕපනායක දක්වාත්, අවිස්සාවේල්ලේ සිට යටියන්තොට දක්වාත් දුම්රිය සේවයක් අවශ්‍ය බව කියමින් සිටියහ. මෙය සැලවූ වහාම එංගලන්තයේ කොම්පැනි කාරයෝ ලංකාවේ ඉංග්‍රීසි ආණ්ඩුකාර වරයා විශාල අල්ලසකින් පොළඹවාගෙන කැළණි වැලි දුම්රිය මාර්ගය ඇරඹූහ .......... ලංකා ඉතිහාසයේ ඔප්පු නොවූ එහෙත්, බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ රැව්දුන් මහා පරිමාණයේ අල්ලස් අන්දරය එය වේ.***

මේ කොමිෂන් සභාවෙත්, තැපැල් ඇමති C. A. S. මරික්කාර් (කඩුගන්නාව) නියොජ්‍ය කම්කරු ඇමති ඇම්. පී. ද සොයිසා (අම්බලංගොඩ - බලපිටිය) හා D. B. මොන්නෑකුලම (කුරුණෑගල)යන මන්ත්‍රීවරුන් වැරදි කරුවන් වූහ. වාර්තාව පිටවන විටත් මන්ත්‍රී ධූරය දරමින් සිටි M. P. ද සොයිසා සහ මොන්නෑකුලම යන මන්ත්‍රීවරු ඉල්ලා අස්වූහ.

1977 පසු, අල්ලස් හා දූෂණ චෝදනා විභාග කිරීමට කොමිෂන් පත් නොකරන ලදී. එහෙත් දකුණු පලාතේ හා නැගෙනහිර පලාතේ මන්ත්‍රීවරුන් දෙදෙනෙකුට පාර්ලිමේන්තුවෙන් පමණක් ඉල්ලා අස්වන ලෙෂ ජනාධිපතිවරයා නියෝග කලේය. එසේම එබඳු චෝදනා ලැබූ, මධ්‍යම පලාතේ ජ්‍යේෂ්ඨ ඇමති වරයෙකුටම, ඇමති පදවියෙන් පමණක් ඉල්ලා අස්වන ලෙෂ නියෝග කරන ලදී.

1977 ට පෙර මැතිවරණ වලද දූෂණය ඉතා සීමා සහිත විය. ඊට හේතුව වූයේ මැතිවරණයකට තරග කරන සියළුම අපේක්ෂකයන් සිය මැතිවරණ වියදම් පිළිබඳ සහතිකයක් මැතිවරණ කොමසාරිස්වරයාට ඉදිරිපත් කිරීම අනිවාර්ය වීමය. එසේම මැතිවරණ පෙත්සම් පිළිබඳව ද විශාල බියක්, අපේක්ෂකයන් අතර තිබුණි. එහෙත් 1978, අළුත් මැතිවරණ ක්‍රමය යටතේ, වියදම් කලහැකි මුදල් ප්‍රමාණය අසීමිතය. මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් කිරීම, මහමෙර පෙරලීමටත් වඩා දුෂ්කර කාර්යයකි. ඒ නිසා ඇති වී තිබෙන, අල්ලස් දූෂණ ව්‍යාපෘතිය, කියා නිමකල නොහැකි තරම්ය.



*ඉන්දියාවේ හිටපු නියෝජ්‍ය මහ කොමසාරිස්*

එස්. පියසේන

